Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 62 S I,II

නම: ............................................ පුරවැසි අධ්‍යාපනය කාලය පැය දෙකයි

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
★ ප්‍රශ්න අංක 01 - 05 දක්වා වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ආයතන වල ආරම්භය ................................ පාලන යුගයේ දී සිදුවිය.
(පෘතුග්‍රීසි / ලන්දේසි /බ්‍රිතාන්‍ය)

02) ඒක පක්ෂ ක්‍රමය පවතින රටක් ලෙස .................................... හඳුනාගත හැකිය.
(කියුබාව / ඉන්දියාව / එක්සත් රාජධානිය)

03) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මඟින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමේ දී සම්පූර්ණ කළ යුතු වයස් සීමාව ලෙස දක්වා තිබුනේ ............................................... යි.
(අවුරුදු 18 / අවුරුදු 21 / අවුරුදු 25)

04) රිය නියාමකයන් ලෙස පාසල් සිසුන් පුහුණු කිරීම ..................................... ඉටු කරන සේවයකි.
(පාසල / පොලිසිය / ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

05) සමූපකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකෙන්නේ බ්‍රිතාන්‍ය ජාතික ....................... මහතා ය.
(රොබට් ඕවන් / ඒබ්‍රහම් ලින්කන් / මොරිස් ඩුවයිජර්)

★ ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති වගන්ති නිවැරදි නම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06) ගැටුමක් නිරාකරණය කර ගත හැකි සරලම ක්‍රමය සමථකරණයයි ( )

07) කිසිදු භේදයකින් තොරව නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට මැතිවරණවල දී ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය සර්වජන ඡන්ද බලයයි ( )

08) නව තාක්ෂණික සොයා ගැනීම් නිසා ශ්‍රම විභජනය හා විශේෂීකරණය වේගවත් වී ඇත. ( )

09) යහජීවනය සමාජ ප්‍රගමනය සඳහා අවශ්‍ය සාධකයකි. ( )

10) ශ්‍රී ලංකාව තුළ අධිකරණ විද්‍යාව, ආහාර විද්‍යාව යන ක්ෂේත්‍ර සම්බන්ධව විශ්ලේෂණ හා විශේෂඥ උපදේශන සේවා සපයන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසිනි ( ) (ල.2 x 5=10)

★ ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න හොඳින් කියවා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11) රටක හෝ සමාජයක සියලු දෙනාම අවනත විය යුතු, රාජ්‍ය විසින් පනවනු ලබන සමස්ත රෙගුලාසි පද්ධතිය වන්නේ,
1. සංස්කෘතිය 2. නීතිය 3. ආචාරධර්ම 4. සිරිත් විරිත්

12) මැතිවරණයක දී යම් කිසි පක්ෂයක් හෝ කණ්ඩායමක් ලබාගත් ඡන්ද සංඛ්‍යාවට අදාළව මන්ත්‍රීධුර බෙදා හැරීමේ නියෝජන ක්‍රමය වන්නේ,
1. සරල බහුතර නියෝජන ක්‍රමය 2. සමානුපාතික නියෝජන ක්‍රමය
3. ප්‍රාදේශීය නියෝජන ක්‍රමය 4. සුළු ජාතික නියෝජන ක්‍රමය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13) රටක ආගම් හෝ ජන කණ්ඩායම් 02 ක් අතර ඇතිවන ගැටුම් අයත් වන ගැටුම් වර්ගය වන්නේ,
1. දේශපාලන ගැටුම්
2. ආර්ථික ගැටුම්
3. සමාජ ගැටුම්
4. පුද්ගල ගැටුම්

14) ආර්ථිකයක පවත්නා සම්පත් මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරගත හැකි ආකාරයට වෙනස් කිරීම හඳුන්වන්නේ,
1. වෙළඳාම 2. පරිභෝජනය 3. බෙදාහැරීම 4. නිෂ්පාදනය

15) අපරාධ නීතිය යටතේ දඬුවම් හිමිවන වැරදි වලට අයත් වන්නකි.
1. ළමා අපයෝජන
2. ඉඩම් ගැටලු
3. දික්කසාද සම්බන්ධ ගැටලු
4. අයිතිවාසිකම් සම්බන්ධ ගැටලු

★ අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.


A


B

16) A පින්තූරයේ දැක්වෙන්නේ ............................................. තුළ නවීන තාක්ෂණය භාවිතා කරන අවස්ථාවකි.

17) එය හඳුන්වන්නේ ................................................. වගා ක්‍රමය ලෙසයි

18) සංවෘත ගෘහයක් තුළ වගා කිරීමේ ක්‍රමවේදය ...................................... වගාවක් ලෙස හඳුන්වයි.

19) B පින්තූරයේ දැක්වෙන්නේ අතීතයේ ....................................... සඳහා භාවිතා කළ උපක්‍රමයකි.

20) වර්තමාන මිනිසුන්ට දුරකථනය අත්‍යාවශ්‍ය උපකරණයක් වන අතර, ............................................ එය සොයා ගැනීමේ ගෞරවය හිමිවන පුද්ගලයා වේ.

(20 x 2 = 20)

## II කොටස

★ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.

01) i. නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රධාන කොටස් 02 කි. ඒවා සඳහන් කරන්න.
ii. නීතියේ මූලාශ්‍ර 02 ක් සඳහන් කරන්න.
iii. ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි 03 කි. ඉන් 02 ක් ලියන්න.
iv. යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීමෙන් ඇතිවන අයහපත් ප්‍රතිවිපාක 02 ක් සඳහන් කරන්න.
v. තිරසාර සංවර්ධනය ඇතිකර ගැනීම සඳහා යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන වාසි 02 ක් සඳහන් කරන්න.
vi. අන්‍යෝන්‍ය රැදියාවෙන් කටයුතු කිරීමේ අරමුණින් ලෝකයේ රටවල් එක්ව පිහිටුවාගෙන ඇති සංවිධාන 02 ක් නම් කරන්න.
vii. ශ්‍රී ලංකාවේ වැඩිම මහනගර සභා ගණනක් පිහිටි පළාත හා දිස්ත්‍රික්කය නම් කරන්න.
viii. නාගරික ප්‍රදේශයක එක්රැස්වන කසළ කළමනාකරණයේ දී අදාළ පළාත් පාලන ආයතනයට ගත හැකි ක්‍රියාමාර්ග 02 ක් යෝජනා කරන්න. (ල. 2 x 8 = 16)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


02) i. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක අධිකරණය සතු කාර්යයන් 02 ක් සඳහන් කරන්න. (ල.02)

ii. ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන 03 ක් නම් කරන්න. (ල.03)

iii. සමථ මණ්ඩලය හා සම්බන්ධව පුද්ගල වගකීම් හා යුතුකම් 03 ක් සඳහන් කරන්න. (ල.03)

iv. සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා පොදුවේ ආරක්ෂක හමුදා ඉටුකරන කාර්යයන් 03 ක් ලියන්න.(ල.03)

03) i. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප 02 ක් සඳහන් කරමින් පහත චාර්ට් සටහන සම්පූර්ණ කරන්න.




(ල.02)

ii. ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක 02 ක් සඳහන් කරන්න. (ල.02)

iii. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් 02 ක් ලියන්න. (ල.02)

iv. ස්ථිරසාරභාවය ගොඩනගා ගැනීම සඳහා පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 02 ක් ලියන්න. (ල.02)

v. පාසල් ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක වශයෙන් ජාතිය ගොඩනැගීම සඳහා ඔබට දායක විය හැකි ආකාර 03 ක් සඳහන් කරන්න. (ල.03)

04) i. වැඩ ලෝකය තුළ දැකිය හැකි ස්වයං රැකියා 02 ක් සඳහන් කරන්න. (ල.02)

ii. රැකියා දැන්වීමක් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රධාන ක්‍රමවේද 03 කි. එම ක්‍රමවේද 03 නම් කරන්න. (ල.03)

iii. රැකියා ඇබෑර්තුවක් සඳහා අවසාන දිනය තෙක් නොසිට තම අයදුම්පත යැවීමේ වාසි 02 ක් ලියන්න. (ල.02)


iv. සම්මුඛ පරීක්ෂණයක් යනු තරඟකාරී අවස්ථාවකි. එබැවින් සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් සඳහන් කරන්න. (ල.04)

05) i. පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සම්බන්ධයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආයතනය → / තනතුර ↓ | මහනගර සභාව | නගර සභාව/ප්‍රාදේශීය සභාව |
|---|---|---|
| ප්‍රධානියා | 1. ............................ | 4. ............................ |
| උප ප්‍රධානියා | 2. ............................ | 5. ............................ |
| පරිපාලන නිලධාරී | 3. ............................ | 6. ............................ |

(ල.06)

ii. පළාත් පාලන ආයතනවල අවශ්‍යතා සහ ඉන් ඉටු කෙරෙන සේවා ආශ්‍රයෙන් හිස්තැන් පුරවන්න.




(ල.03)

iii. පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටුකළ යුතු යුතුකම් 02 ක් සඳහන් කරන්න. (ල.02)

06) i. ගැටුම් ඇතිවන පාර්ශව 02 ක් සඳහන් කරන්න. (ල.02)

ii. ගැටුම් නිරාකරණය සඳහා යෝග්‍ය ක්‍රමවේද වල ලක්ෂණ ආශ්‍රයෙන් හිස්තැන් පුරවන්න.

A. සාකච්ඡා කිරීම - 1. ......................................................

B. මැදිහත්කරණය - 1. ......................................................

C. සමථකරණය - 1. ......................................................

D. විනිසීම - 1. ...................................................... 2. ......................................................

E. උපදේශනය - 1. ...................................................... (ල.06)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iii. ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය පුද්ගල ගුණාංග 02 ක් සහ ගැටුම් ශුභවාදී ව නිරාකරණය කර ගැනීම නිසා ඇතිවන එක් වාසියක් සඳහන් කරන්න.

පුද්ගල ගුණාංග ⟶ 1. ....................................
2 . ....................................

වාසි ⟶ 1. .................................... (ල.03)

07) i. පෞද්ගලික මූල්‍ය කළමනාකරණයේ දී ඔබේ පවුලට ආදායම් ලැබෙන ක්‍රම 03 ක් සහ වියදම් වන ක්‍රම 02 ක් සඳහන් කරන්න.

පෞද්ගලික මූල්‍ය කළමනාකරණය

| ආදායම | වියදම |
| --- | --- |
| 1. ............................ | 4. ............................ |
| 2. ............................ | 5. ............................ |
| 3. ............................ | |

(ල.05)

ii. ණය පත් භාවිතයේ වාසි 01 ක් සහ අවාසි 01 ක් සඳහන් කරන්න. (ල.02)

iii. තම පෞද්ගලික හැසිරීම මනාව පවත්වා ගැනීමේ දී සැලකිය යුතු කරුණු 02 ක් සඳහන් කරන්න. (ල.02)

iv. පාසල් සිසුවෙක් ලෙස ඔබට කාල කළමනාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 02 ක් සඳහන් කරන්න. (ල.02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**පුරවැසි අධ්‍යාපනය - 9 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

**<u>I කොටස</u>**

01) බ්‍රිතාන්‍ය 02) කියුබාව 03) අවු. 21 04) පොලිසිය 05) රොබට් ඕවන් 06) x 07) ✔ 08) ✔ 09) ✔ 10) x
11) 2 12) 2 13) 3 14) 4 15) 1 16) කෘෂිකර්මාන්තය 17) හයිඩ්‍රොෆෝනික්ස් 18) හරිතාගාර
19) සංනිවේදනය 20) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්

**<u>II කොටස</u>**

01) i. දේශීය නීතිය, අන්තර්ජාතික නීතිය
ii. ● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ● අධිකරණ තීරණ ● ව්‍යවස්ථා (අණ පනත්) ● ආගම ...................... පිටුව (11)
iii. ● නිෂ්පාදනය ● බෙදාහැරීම ● පරිභෝජනය
iv. මිනිසාගේ ජීවිත කාලය අවාසනාවන්ත ලෙස ගෙවී යාම, අන්තර් පුද්ගල සබඳතා බිඳවැටීමෙන් පුද්ගලයා හුදෙකලා වීම, නාස්තිය වැඩි වීම... (පිටුව 48)
v. සම්පත් අපතේ යාම වැළකීම, ශ්‍රම සම්පත් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම (පිටුව 31)
vi. ● එක්සත් ජාතීන්ගේ සංවිධානය, සාර්ක් සංවිධානය, යුරෝපා හවුල .............................. නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.
vii. ● පළාත - බස්නාහිර ● දිස්ත්‍රික්කය - කොළඹ
viii. ● කසල එක්රැස් කිරීම ● කාබනික පොහොර නිෂ්පාදනයට සැලසුම් සකස් කිරීම ● ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් සැලසුම් කිරීම (පිටුව 108)

02) i. ● යුක්තිය පසිඳලීම ● පුරවැසි නිදහස හා මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
ii. ● ශ්‍රේෂ්ඨාධිකරණය ● මහාධිකරණය ● අභියාචනාධිකරණය ● දිසා අධිකරණය ● පළාත් බඳ මහාධිකරණය ● මහේස්ත්‍රාත් අධිකරණය
iii. ● ආරවුල් යොමු කිරීමේ නිවැරදි ක්‍රියාපටිපාටිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම................ (පිටුව 23)
iv. ● දේශීය විදේශිය රටවලින් එල්ලවිය හැකි යුද්ධමය තත්ව වලින් රට ආරක්ෂා කිරීම ● කැරලි කෝලාහල හා ත්‍රස්තවාදී ක්‍රියා මර්ධනය
● හදිසි ආපදා හා විපත් අවස්ථාවල දී සහන සැලසීම (පිටුව 18)
v. සම්පත් අපතේ යාම වැළකීම, ශ්‍රම සම්පත් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම (පිටුව 31)

03) i. ● සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ● වක්‍ර / නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය
ii. ● ජනතාවගේ දේශපාලන දැනුම සහ අවබෝධය ඉහළ මට්ටමක වීම ● කැපවීමෙන් නටයුතු කරන අවංක හා උදාර නායකත්වයක් පැවතීම
● රටතුළ යහපත් ආර්ථික මට්ටමක් පැවතීම....... (පිටුව 72)
iii. ● ජීවත් වීමේ අයිතිය ● අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ● නීත්‍යානුකුල රැකියාවක යෙදීමට ඇති අයිතිය..... (පිටුව 74)
iv. ● සාධාරණත්වය අගය කිරීම ● මෘදු බව ● ආවේගශීලී නොවීම ● නීතිගරුක බව ● අවංක බව..... (පිටුව 84)
v. ● තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම ● දැරිය හැකි ජීවන රටාවක් පවත්වාගෙන යාම ● පොදු දේපළ සුරැකීම
● පරිසරය ආරක්ෂා කිරීම..... (පිටුව 88)

04) i. ● කුලී රථ සේවය ● කෑම සැකසීම ● ව්‍යාපාර ● මල් පැළ අලෙවිය (නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න)
ii. ● ජීවදත්ත පත්‍රිකාවක් මගින් ● රැකියා ඉල්ලුම් පත්‍රයක් මගින් ● ලිපියක් මගින්
iii. ● තැපෑලේ දී ඇතිවිය හැකි ප්‍රමාද දෝෂ මග හරවා ගැනීම ● අයදුම්කරු අදාළ ඇබෑර්තුව සම්බන්ධයෙන් දක්වන උනන්දුව පිළිබඳ සේවායෝජකයාට දැනගත හැකි වීම
iv. ● (පිටුව 145 - 147)

05) i. 1. නගරාධිපති / පුරපති 2. උපනගරාධිපති 3. නාගරික කොමසාරිස් 4. සභාපති 5. උපසභාපති 6. ලේකම්
ii. අවශ්‍යතා ● ප්‍රජා සේවා විධිමත්ව පවත්වාගෙන යාමට පහසු වීම ● ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රාදේශීය මට්ටම දක්වා පුළුල් කිරීම ● ප්‍රාදේශීය සංවර්ධනය පුළුල් කිරීම (පිටුව 92)
ඉටු කෙරෙන සේවා ● පුස්තකාල, කියවීම් ශාලා, ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි, ඇවිදින මංතීරු පවත්වාගෙන යාම ● පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම ● බල ප්‍රදේශයට අයත් මාර්ග ප්‍රතිසංස්කරණය........... (පිටුව 102, 103, 104)
iii. ● කලට වේලාවට නියමිත බදු ගෙවීම ● සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම ● පරිසරය පිරිසිදුව තබා ගැනීම හා පරිසර සංරක්ෂණයට දායක වීම ● පොදු දේපළ ආරක්ෂා කිරීම........... (පිටුව 105)

06) i. ● තමා තුළ ● තමන් හා මිතුරන් අතර ● පවුලක් තුළ ● ස්වකීය රාජ්‍ය තුළ / රාජ්‍ය දෙකක් අතර ● ආගම් / ජන වර්ග අතර
A ● සරලව ගැටුම් නිරාකරණ ක්‍රමවේදයකි ● දෙපාර්ශවයටම ජය - ජය විසඳුම් ලබාගත හැකිය
B ● ගැටුමක් විසඳා ගැනීමට සාකච්ඡා ක්‍රමය අපොහොසත් වන විට එය විසඳා ගැනීමට උපකාර කිරීම මැදිහත්කරණයයි
● සාමකාමී ක්‍රියාමාර්ගයකි ● ගැටුම විසඳා ගැනීම සඳහා පාර්ශව දෙකටම පිළිගත හැකි පුද්ගලයෙකු හෝ බාහිර පාර්ශවයක් යොදා ගනී
C ● සමථකරුවන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසින් සමථකරණය සිදුකරයි
D ● මෙය අධිකරණමය ක්‍රියාමාර්ගයකි ● නඩු විභාගයට යාම මඟින් ගැටුම් නිරාකරණය කරනු ලබයි ● අධිකරණය ලබා දෙන තීන්දුව අවසාන තීරණය වේ ● අවසන් තීරණයට එකඟ නොවන පාර්ශවවලට ඉහළ අධිකරණයට අභියාචනා කළ හැකිය
E ● විවිධාකාර පහසුකම් සපයා උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමු කරයි ● ගැටුම් නිසා ඇතිවන ප්‍රතිවිපාක හා සාමකාමීව ආරවුල් විසඳා ගැනීමේ වාසි පිළිබඳ දෙපාර්ශවයම දැනුවත් කෙරේ
iii. ● (පිටුව 116) ඉවසීම, සක්‍රිය සවන් දීම, කාරුණික බව..............
● වාසි - විශ්වාසය ගොඩනැගේ, මානසික ආතතිය අවම වේ............ (පිටුව 119)

07) i.

| <u>ආදායම්</u> | <u>වියදම්</u> |
|---|---|
| ● වැටුප, ● පොලී, ● ලාභාංශ | ● පරිභෝජනය, ● අධ්‍යාපනය, ●ණය ගෙවීම........... (පිටුව 152) |

ii. වාසි → ● මුදල් එහා මෙහා ගෙන යාමට වඩාත් ආරක්ෂාකාරී වේ ● පොලී රහිත ගෙවීම් කාල හිමි වේ
අවාසි → ● ඇතැම් විට කමන්ට ඔරොත්තු නොදෙන පරිභෝජනයකට පෙළඹීමේ අවදානම ● ඉහළ පොලී අනුපාත අය කිරීම...(පිටුව 155)
iii. ● ආයතනයේ සෑම නිලයකටම ගරු කිරීම ● උපරිමයෙන් කැප වී කටයුතු කිරීම ● නියමිත වේලාවට වැඩට පැමිණීම ● පිළිවෙළකට ඇඳුම් පැලඳුම් සකස් කර ගැනීම ................. (පිටුව 151)
iv. ● දෛනික කාල සටහනක් අනුගමනය කිරීම ● එක් එක් කාර්ය සඳහා යම් කාල සීමාවක් තීරණය කිරීම ● දවස අවසානයේ දී තමන් සැලසුම් කළ කටයුතුවල ප්‍රගතිය පරීක්ෂා කිරීම................ (නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න)